

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2020

ලෝහෝර් ආර්යා ණය අරමුදල – මුදල් අමාත්‍යාංශය
லோஹோர் சீமாட்டி கடன் நிதியம் - நிதி அமைச்சு
Lady Lochore Loan Fund - Ministry of Finance



වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2020

ලෝහෝර් ආර්යා ණය අරමුදල – මුදල් අමාත්‍යාංශය
லோஹோர் சீமாட்டி கடன் நிதியம் - நிதி அமைச்சு
Lady Lochore Loan Fund - Ministry of Finance

පටුන

සංස්ථාපිත තොරතුරු 01

සභාපතිතුමාගේ පණිවිඩය 02

පාලන භාරකාරතුමියගේ පණිවිඩය 03

1. අරමුදලේ පසුබිම 04

1.1 භාරකාර මණ්ඩලය 04

- 2020 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය 05

1.2 සංවිධාන ව්‍යුහය 05

2. **2020 වසරේ අරමුදලෙහි කාර්යසාධනය**

2.1 2020 වසරේ ප්‍රතිලාභීන් 06-09
2.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය 10-11
2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම 11
2.4 ණය අයකර ගැනීමේ ප්‍රගතිය 11-12
2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල 12
2.5.1 කුලී ආදායම 12
2.5.2 අරමුදලෙහි තිරසාරභාවය 13
2.5.3 මෙහෙයුම් ආදායම 13

3. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම 14
3.2 අරමුදලේ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටින් 14

- නව බඳවා ගැනීම් 14

3.3 අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීම 15
3.4 කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම 15
3.5 කාර්ය මණ්ඩල ණය 15
3.6 ඉඩම් ඔප්පු සහ බැදුම්කර 15
3.7 රැස්වීම් 15
3.8 විගණන හා කළමණාකරණ කමිටුව 15

4. අනාගත සැලසුම් 16
5. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 17
6. ආදායම් ප්‍රකාශනය 18
7. මූල්‍ය තත්ව ප්‍රකාශනය 19
8. ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය 20
9. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 21
10. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති
    - පොදු 22
    - වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම 22-23
    - වගකීම් සහ ප්‍රතිපාදන 23
    - ආදායම් ප්‍රකාශනය 24
11. මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන් 25-29

ලෝහෝර් ආර්යා ණය අරමුදල

දැක්ම

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා මූල්‍ය පහසුකම්
සලසා දෙනු ලබන ප්‍රමුඛ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.

මෙහෙවර

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ණය බරින් මුදවා යහපත් මානසික
පරිසරයකින් යුත්
රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා දායකවීම.

අරමුණ

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් හා
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා සහනශීලි පොලී අනුපාතයක් හා
පහසු කොන්දේසි මත
කෙටි කාලීන ණය මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම මඟින්
ඔවුන්ව ණය බරින් මුදවා ගැනීම.

කාර්ය භාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් සේවා ලාභීන් සඳහා ණය පහසුකම් සැපයීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ එයට සාපේක්ෂව ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටින් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ණය කළමනාකරණය සඳහා යෝග්‍ය වන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් කාර්යක්ෂමව කිරීම සහ වැඩි දියුණු කිරීම.
- අනිකුත් රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා වූ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී පහසු කාරකයෙකු වශයෙන් කටයුතු කිරීම.
- ණය ලබා දීමේ දී හා කටයුතු පවත්වාගෙන යාමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රමවේදයක් ඇතිව කටයුතු කිරීම.

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම ලිපිනය :

- **ලෝහෝර් ආර්යා ණය අරමුදල**
- 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

සංස්ථාපිත කිරීම :

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

භාරකාර මණ්ඩලය :

➢ ඒ. පී. කුරුම්බලපිටිය මහතා	-	සභාපති (අධ්‍යක්ෂ ජනරාල් - කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව),මුදල් අමාත්‍යාංශය.
➢ කමලා රණතුංග මැතිණිය	-	පාලන භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	-	භාරකාර (2020.02.05 සිට)
➢ ප්‍රදීප් නිරෝෂන් වීරසිංහ මහතා	-	භාරකාර (2020.10.29 සිට)
➢ ඒ.එස්.පී.එස්.පී.සංජීව මහතා	-	භාරකාර (2020.10.29 සිට)

විගණන කමිටුව :

➢ කේ.එම්.බී.පී.වීරසිංහ මැතිණිය	- සභාපති, (ප්‍රධාන ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය)
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)
➢ ඒ.එස්.පී.එස්.පී.සංජීව මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)

විගණක: රන්වත්ත සහ සමාගම,
වරලත් ගණකාධිකාරී,
141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

නිල බැංකුකරු: මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

සභාපතිතුමාගේ පණිවුඩය

ස්කොට්ලන්ත ජාතික ජින් ලෝහෝර් ආර්යාවගේ මූලික ධන පරිත්‍යාගයෙන් 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවන ලදී.

ඒ අනුව දශක 9 කට ආසන්න කාලයක් තුළ රාජ්‍ය අංශයේ සේවකයන් හට මූල්‍ය පහසුකම් සලසා දෙනු ලබන ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියාකිරීම දැක්ම කර ගත් මෙම අරමුදල රාජ්‍ය අංශයේ විවිධ ස්ථරවල නිලධාරීන් හට ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මහඟු සේවයක් සලසා දී ඇත.

විශේෂයෙන් විධිමත් වාණිජ බැංකු පරිවයේ ඇති දැඩි මූල්‍ය කොන්දේසි හා අවිධිමත් පුද්ගලික අංශයේ ඇති අසාධාරණ ණය කොන්දේසි වලින් බැහැරට රාජ්‍ය නිළධාරීන්ගේ අභිමානය රැකෙන පරිදි ඔවුන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාගත හැකි රාජ්‍ය අංශයේ පාලනය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධානම මූල්‍ය පහසුකම් සපයන ආයතනය ලෙස පසුගිය දශක 09 ක කාලය දෙස ආපසු හැරී බැලීමේදී එහි ක්‍රියාකාරිත්වය තුළින් තහවුරු වී ඇත.

අරමුදලේ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී අරමුදල පිහිටුවන ලද වර්ෂයේ සිට ක්‍රමිකව එහි මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර විශේෂයෙන් වෙනත් පාඩු ලබන රාජ්‍ය අංශයේ ව්‍යවසායකයන් හා සැසඳීමේදී මහා භාණ්ඩාගාරයට බරක් නොවී වාර්ෂිකව විශාල බදු ආදායමක්ද ඒකාබද්ධ අරමුදලට ලබාදෙමින් ස්වෝත්සාහය මත මෙම අරමුදල අද දක්වා වර්ධනය වී ඇති අතර 2020/21 මූල්‍ය වර්ෂය වන විට රුපියල් මිලියන 360 ක පමණ ස්ථාවර වත්කම් වටිනාකමක් හා ආයතනයේ ද්‍රවශීලතාවය පවත්වාගෙන යාම සඳහා රු. මි. 366 ක පමණ ජංගම වත්කම් ප්‍රමාණයක් අරමුදල සතුවේ.

විශේෂයෙන් 2019/2020/2021 වර්ෂ වල කෝවිඩ් වසංගත තත්වය තුළ ආයතනයේ ක්‍රියාකාරිත්වයට විශාල බලපෑමක් සිදුවුවද අඛණ්ඩව එහි මූල්‍ය කාර්යසාධනය වර්ධනය කරගත හැකිවිය. මෙහිදී විවිධ දුෂ්කරතා මධ්‍යයේ අරමුදලේ කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය එම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අතර ඒ සඳහා ඔවුන් හට මාගේ ප්‍රණාමය පුද කරමි.

විශේෂයෙන් ආයතනයේ කාර්යසාධනය ප්‍රධාන වශයෙන් තීරණය වනුයේ අරමුදලේ ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් තීරණ ගනු ලබන පාලක මණ්ඩලය සහ එම තීරණ ක්‍රියාත්මක කරනු ලබන කාර්ය මණ්ඩලයේ කැපවීම මතය. ඒ අනුව 2015 වසරේ සිට මෙම අරමුදලේ සභාපති ලෙස කටයුතු කළ මා හට පැවති සියලුම පාලක මණ්ඩල වල සාමාජිකයන් හා පාලන භාරකරුවන් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් දැක්වූ දායකත්වය අතිමහත්ය. ඔවුන්ගේ එම වෘත්තිමය දායකත්වය හා කැපවීම නොමැතිව මෙම අරමුදලේ වර්තමාන ප්‍රගතිය කිසිසේත් ලඟාකර ගත නොහැක. එබැවින් එම සියලුම සහෘදයන් වෙනුවෙන් මාගේ ප්‍රණාමය පළ කරමි.

අවසාන වශයෙන් පසුගිය වසර කිහිපය තුළ රටතුළ වර්ධනය වූ අහිතකර සෞඛ්‍යමය තත්වයන් හා ආර්ථික පසුබැසීම් වාතාවරණයක් යටතේ 2019/20 ට සාපේක්ෂව අරමුදලේ කාර්යසාධනය හා මූල්‍ය තත්වය වර්ධනය කරගැනීමටත්, ප්‍රතිපත්තිමය වශයෙන් අරමුදලේ මෙහෙයුම් කටයුතු වල කාර්යක්ෂමතාව හා ඵලදායිත්වය වර්ධනය කරගැනීමටත්, ආයතනයේ තිරසාර බව තහවුරු කර ගැනීම සඳහාත් අවශ්‍ය නායකත්වය හා දායකත්වය ලබාදීමට හැකිවීම පිළිබඳව සතුටුවෙමි.

ඒ.පී. කුරුම්බලපිටිය
සභාපති
ලෝහෝර් ආර්යා ණය අරමුදල.

පාලන භාරකාරතුමාගේ පණිවුඩය


අරමුදලේ නිර්මාතෘවරිය වන ස්කොට්ලන්ත ජාතික ජින් ලෝහෝර් ආර්යාව විසින් තම පෞද්ගලික ධන පරිත්‍යාගයක් ලෙස පවුම් 300 ක මුදලක් යොදවා පිහිටවනු ලැබූ මෙම ලෝහෝර් ආර්යා ණය අරමුදල 1927 වර්ෂයේ සිට වර්තමානය තෙක්, එහි ආරම්භක අරමුණ වූ ණය බරින් පීඩිතවූවන් ඉන් ගලවාගෙන සහන සැලසීම සඳහා මාසික චේතනයන් භුක්ති විඳිනු ලබන රාජ්‍ය සේවකයින්ගේ ගෞරවය හා අභිමානය රැකගනිමින් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් පවත්වා ගැනීමට 2020 වසරේදී ද රුකුලක් වී ඇත.

2020 වර්ෂයේදී විවිධ තරා තිරම් වල රාජ්‍ය සේවකයින් 1735 දෙනෙකු වෙත රුපියල් මිලියන 217.8 ක් වූ ණය පහසුකමක් අරමුදල විසින් ලබා දීමට සමත් වී තිබීම මත මෙහි නිර්මාතෘතුමියගේ ආරම්භක අරමුණු තව දුරටත් ශක්තිමත් ලෙස සඵල කර ගැනීමට සමත් වී ඇත.රුපියල් මිලියන 429.9 ක අවකරණ වටිනාකමක් මෙම වර්ෂයේදී ණය නිකුත් කිරීම මඟින් අය කර ගෙන ඇති අතර 2019 වර්ෂයට සාපේක්ෂව මෙම සංඛ්‍යා හා වටිනාකම යම් පසුබෑමකට ලක් වී ඇති බවද නිරීක්ෂණය කරමි.2020 වර්ෂයේදී දින 246 ක කාලයක් මෙහි මෙහෙයුම් කටයුත්ත් සිදු කළ යුතුව තිබූ නමුත් කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාලය දින 44 ක් වසා තැබීමට සිදු වීමද ඉන් පසුවද අවම සේවක සංඛ්‍යාවක් මඟින් කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම මත 2020 වර්ෂයේ වර්ධනයක් පෙන්නුම් කිරීමට නොහැකි වී ඇත.

එවැනි පසුබිමක් තුල වුවද රුපියල් මිලියන 114.4 ක් වූ මුළු ආදායමක් වසර තුල ඉපැයීමට අරමුදල සමත් වී ඇති අතර මින් රුපියල් මිලියන 48.4 ක මෙහෙයුම් වියදමක් දැරීමෙන් අනතුරුව රුපියල් මිලියන 65.9 ක බදු පෙර ශුද්ධ ලාභයක් ඉපැයීමටද රුපියල් මිලියන 13.1 ක බදු මුදලක් රජයට උපයා දීමෙන් පසුව රුපියල් මිලියන 52.7 ක බදු පසු ශුද්ධ ලාභයක් ඉපැයීමට මෙම වසරේදී සමත් වී ඇත.පසුගිය වර්ෂයට සාපේක්ෂව 25.2% වර්ධනයකින් මෙම වර්ෂයේදී බදු පසු ශුද්ධ ලාභය වර්ධනය කර ගැනීමට හැකි වීම අප ආයතනය ලැබූ සුවිශේෂී ජයග්‍රහනයකි.

මෙම ලැබූ සාර්ථකත්වයට හා සියලු කර්තව්‍යයන් සඳහා මඟ පෙන්වන මුදල්,ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයත්,කාර්ය සාධන ප්‍රතිපත්තීන් මෙහෙය වන භාරකාර මණ්ඩලයත්, ඇපකැප වී නොපිරිහෙලා තම කාර්ය ඉටු කරන අරමුදලේ සමස්ථ කාර්ය මණ්ඩලයත් ලැබූ මෙම සාර්ථකත්වයේ නියමුවන් ලෙස හැඳින්විය හැක.ඉදිරියේදී මෙම සේවාව වඩාත් පුළුල්ව ජාතික වශයෙන් විවිධ ක්ෂේත්‍රයන් සඳහා ණය අවශ්‍යතා සපුරන ජනතා හිතවාදී වඩාත් කාර්යක්ෂම ආයතනයක් බවට පත් කිරීමට අප සියලු දෙනාම අරමුණු පෙරදැරි කර ගෙන සිටිමු.

ලෝහෝර් ආර්යා ණය අරමුදල මෙරට ප්‍රමුඛ පෙලේ මූල්‍ය ආයතනයක් බවට පත් කර දීමටත් අරමුදලේ දැක්ම මෙහෙවර අනුව ක්‍රියාකරමින් එකී අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට භාරකාර මණ්ඩලයට හා කාර්ය මණ්ඩලයට ශක්තිය ධෛර්ය හා වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.



කමලා රණතුංග
පාලන භාරකාර
ලෝහෝර් ආර්යා ණය අරමුදල

01

අරමුදලේ පසුබිම

ශ්‍රී ලංකාවේ කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ.වී.නැතනියල්ස් පියතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදී. එමෙන්ම අරමුදල 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් විය.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ එම ණය ආපසු අයකර ගනිමින් චක්‍රිය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදු වී සිටියහ. මේ පසුබිම තුල රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනීමේදි ඉමහත් සහනයක් සැලසුනි. 1951 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගි කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.



ජීන් ලෝහෝර් ආර්යාව

1.1. භාරකාර මණ්ඩලය




භාරකාර මණ්ඩලය ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම්ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසක ධුරය මුදල් අමාත්‍යතුමා විසින් හොබවනු ලබයි. අරමුදලෙහි පරිපාලන කටයුතු සඳහා පාලන භාරකරුවකු ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වූ අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 5 වන වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

වගුව 01 – 2020 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව
ගණකාධිකාරී	01	01
පරිපාලන නිලධාරී	01	01
ගිණුම් නිලධාරී	01	01
අභ්‍යන්තර විගණක නිලධාරී	01	01
ණය අයකර ගැනීමේ නිලධාරී	01	01
තොරතුරු තාක්ෂණ නිලධාරී	01	-
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ශ්‍රේණිය)(ලේඛනාගාර සහකාර ඇතුළු)	34 (35)	32
ගොඩනැගිලි අධීක්ෂක (කළමනාකරණ සහකාර - තාක්ෂණික ශ්‍රේණිය)	01 (35)	-
කාර්යාල කාර්ය සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන)(නිල බංගලා භාරකරු ඇතුළුව)	07	06
ගොඩනැගිලි නඩත්තු සහායක (ප්‍රාථමික අර්ධ ශිල්පීය)	01	01
රියදුරු (ප්‍රාථමික ශිල්පීය)	02	02
එකතුව	**51**	**46**

1.2 සංවිධාන ව්‍යුහය



02

2020 වසරේ අරමුදලෙහි කාර්යසාධනය


2.1 2020 වසරේ ප්‍රතිලාභීන්

2020 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 1735 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව දෙවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර ගෝලීය වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීමත් ,විවිධ සීමා පැනවීමත්,බැංකු පොළී අනුපාතිකය රජය විසින් පහත හෙලීමත් හේතුවෙන් 2020 වර්ෂයේදී පෙර වසරට සාපේක්ෂව ණය ප්‍රමාණයේ 55% කින් අඩු වීමක් පෙන්නුම් කරන ලදී. ප්‍රතිලාභීන්ගෙන් 70% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව පහත වගුවෙන් නිරූපනය වේ.

වගුව 02 – 2019/2020 වර්ෂවල ණයලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව

ප්‍රතිලාභීන් සංඛ්‍යාව				
දිස්ත්‍රික්කය	2020	(%)	2019	(%)
කොළඹ	321	18.50	617	15.94
ගම්පහ	243	14.01	603	15.58
අනුරාධපුරය	88	5.07	182	4.70
මහනුවර	98	5.65	236	6.10
වව්නියාව	3	0.17	6	0.16
කළුතර	168	9.68	349	9.02
රත්නපුර	67	3.86	153	3.95
ගාල්ල	90	5.19	239	6.18
කුරුණෑගල	189	10.89	410	10.59
පුත්තලම	24	1.38	53	1.37
යාපනය	0	-	0	-
පොළොන්නරුව	32	1.84	87	2.25
ත්‍රිකුණාමලය	9	0.52	13	0.34
මුලතිව්	0	-	0	-
බදුල්ල	53	3.05	134	3.46
මාතලේ	42	2.42	98	2.53
හම්බන්තොට	38	2.19	85	2.20
කෑගල්ල	93	5.36	239	6.18
මඩකලපුව	1	0.06	0	-
අම්පාර	42	2.42	77	1.99
මොනරාගල	46	2.65	98	2.53
නුවරඑළිය	33	1.90	57	1.47
මන්නාරම	0	-	0	-
මාතර	55	3.17	134	3.46
එකතුව	**1735**	**100**	**3870**	**100**

ප්‍රස්තාරය 01 - 2019/2020 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව



වගුව **03** - **2019** හා **2020** වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව

තනතුර	2020	2019
කෝප්‍රල්	428	1016
හමුදා සෙබල	142	328
හමුදා සැරයන්	63	146
මේජර්	21	48
ලුතිනන්	11	31
බ්‍රිගේඩියර්	1	2
අරක්කැමි	7	20
භෝජනාගාර සේවක	2	18
පොලිස් කොස්තාපල්	314	826
පොලිස් සැරයන්	181	283
පොලිස් පරීක්ෂක	15	46
ප්‍රධාන පොලිස් පරීක්ෂක	16	9
උප පොලිස් පරීක්ෂක	28	60
පොලිස් ආරක්ෂක සහායක	0	2
පොලිස් සිවිල් සහායක	0	6
ගිනිහටයන්	3	10
රියදුරු	38	86
රිය සහායක	0	5
බන්ධනාගාර නියාමක	11	25
මැනුම් සහායක	6	14
සෞඛ්‍ය පරිපාලක	0	-
උපස්ථායක	0	4
සාමාන්‍ය කම්කරු	108	206
කාර්යාල කාර්යය සහායක	121	187
කළමනාකරණ සහකාර	76	184
සංවර්ධන සහකාර	12	56
ආයුර්වේද වෛද්‍ය සහායක	0	1
ඖෂධවේදී	0	4
මුරකරු	3	6
ආරක්ෂක නියාමක	0	3
මෝටර් කාර්මික	2	6
කාර්මික ශිල්පි	2	1
වඩු කාර්මික නිලධාරී	2	2
මානව සම්පත් සහකාර	0	1
පරිපාලන නිලධාරී	1	1
පෙදරේරු	0	2
ගණකාධිකාරී	6	6
ගබඩා සහායක	0	1
විදුලි කාර්මික	0	3

ඕවර්සියර්	2	3
සහකාර අධ්‍යක්ෂක	4	10
සහකාර ලේකම්	0	2
පුනරුත්ථාපන නිලධාරී	0	1
සිතාසිකරු	1	1
වනජීවී ආරක්ෂක නිලධාරී	3	1
කාලගුණ විද්‍යා නිලධාරී	0	1
පොත් බැඳුම්කරු	1	4
ග්‍රාම නිලධාරී	0	3
වැඩසටහන් සහකාර	0	3
කොමිෂන් නොලත් නිලධාරි	21	46
ගිණුම් නිලධාරී	0	2
මැනුම් කෂේත්‍ර සහායක	0	3
රසායනාගාර සහායක	0	2
කර්මාන්ත පරිපාලක	0	1
හෙද නිලධාරී	0	3
කපිතාන්	30	52
අස්ගොව්	3	8
අත් උදව්කරු	1	1
කෘෂිකර්ම උපදේශක	0	2
පින්තාරුකරු	0	2
තාක්ෂණ නිලධාරී	1	4
තැපැල්කරු	1	5
තැපැල් නිලධාරී	4	1
රෙජිස්තාර්	0	2
කර්නල්	3	1
පෙර පාසල් ගුරු	0	5
කොමසාරිස්	2	3
පුස්තකාලයාධිපති	0	1
පුස්තකාල සහායක	2	1
ලේත් මැෂින් ක්‍රියාකරු	3	0
ලෝහ පෑස්සුම්කරු	4	0
වෙනත්	29	41
එකතුව	**1735**	**3870**

2.2 2020 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය


පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.
- ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම. (විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 59 ලෙස සලකයි)
- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

වගුව 04 - සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිලිබඳව 2020 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ.

මාසය	ණය අයදුම් කළ සංඛ්‍යාව	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය වටිනාකම (රු.)
ජනවාරි	225	295	37,100,000.00
පෙබරවාරි	297	218	26,415,000.00
මාර්තු	209	119	15,050,000.00
අප්‍රේල්	0	0	0
මැයි	17	125	15,940,000.00
ජූනි	86	158	19,315,000.00
ජූලි	223	212	26,670,000.00
අගෝස්තු	172	173	22,305,000.00
සැප්තැම්බර්	192	220	29,240,000.00
ඔක්තෝබර්	83	111	13,050,000.00
නොවැම්බර්	24	36	4,500,000.00
දෙසැම්බර්	65	68	8,295,000.00
එකතුව	**1593**	**1735**	**217,880,000.00**

ප්‍රස්තාරය 02 - **ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය** - 2020



	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ණය අයදුම් කළ සංඛ්‍යාව	225	297	209	0	17	86	223	172	192	83	24	65
නිකුත් කල ණය සංඛ්‍යාව	295	218	119	0	125	158	212	173	220	111	36	68

ණය අයදුම් කළ සංඛ්‍යාව 1593 වුවද නිකුත් කල ණය සංඛ්‍යාව 1735 ක් විය මෙම වෙනසට ආසන්නම හේතුන් වන්නේ 2019 වසරේ ඔක්තෝම්බර්, නොවැම්බර් ,දෙසැම්බර් යන අවසන් මාසයන් තුල ඇප අත්සන් කිරීමට නොපැමිණි අයදුම්පත් 2020 වසර තුල ලැබීම , 2019 අවසන් මාසයන් තුල දී ලද යුද හමුදාවේ ණය අයදුම් පත් සඳහා ණය නිකුතුවේ දී අවශ්‍ය සී.එල් බලපත්‍ර 2020 වසර තුල ලැබීමද දැක්විය හැක.

2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

2020 වසරේ මෙම වසංගත තත්වය මත ණය ක්‍රමයේ කිසිදු වෙනසක් සිදු නොකරන ලදී.

වගුව **05** - **ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය.**

උපරිම ණය සීමාව (රු.)	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය මුදල් වටිනාකම (රු.)
300,000	57	17,100,000.00
250,000	76	19,000,000.00
175,000	410	71,750,000.00
100,000	1012	101,200,000.00
50,000	168	8,400,000.00
40,000	7	280,000.00
30,000	5	150,000.00
20,000	0	0
10,000	0	0
එකතුව	**1735**	**217,880,000.00**

2.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය


2017 සිට 2020 දක්වා වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 06 වන වගුවෙන් හා 03 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

- ණය මුදල් නිකුත් කිරීම - අඩු වීම - 53.26%
- ණය අයකර ගැනීමේ - අඩු වීම - 9.26%

වගුව 06 – 2017 සිට 2020 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම

වර්ෂය	ණය සංඛ්‍යාව	ණය නිකුත් කිරීම (රු. 000)	ණය අයකර ගැනීම (රු. 000)
2017	4062	365,720	389,506
2018	3636	353,970	411,062
2019	3870	466,220	473,881
2020	**1735**	**217,880**	**429,989**

ප්‍රස්තාරය -03 ණය නිකුත් කිරීම සහ අයකර ගැනීමේ ප්‍රගතිය



2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

2.5.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සහන් ආයතන වලට කුලී පදනම මත ලබා දී 2020 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 17.05 උපයා ගන්නා ලදී.

වගුව 07 – 2020 වසරේ ගොඩනැගිලි කුලී ආදායම

අනු අංක	ආයතනය	කුලියට සිටින මහල	වර්ග අඩි ප්‍රමාණය	ආදායම (රු.)
01	ලෝහෝර් ආර්යා ණය අරමුදල	3 වන මහල	5500	-
02	රථ ගාල	පතුල් මහල	5290	-
03	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	බිම් මහල	5500	7,080,000
04	සමූපකාර සේවක කොමිෂන් සභාව	1 - මහල	2415	2,365,727
05	ලංකා විදුලිබල මණ්ඩලය	1 ,2 මහල	4700	4,800,000
06	ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය	2 - මහල	2750	2,805,132
07	කුලී පදනමට ලබා දීමට තිබේ	2 - මහල	840	-
08	කුලී පදනමට ලබා දීමට තිබේ	අංක :100/2	380	-
			27375	**17,050,859**


2.5.2 අරමුදලෙහි තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත හෝ අයවැය ලේඛන ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් මෙහි පොලී ආදායම සහ ගොඩනැගිලි කුලී ආදායම තුලින් දරනු ලැබේ.පොලී ආදායම තුල මෙහෙයුම් විරස්ථායී බව සහතික කරනු ලබන අතර බොල් ණය, අනෙකුත් පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනීම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියලුම වියදම් ද මෙම ආදායම තුල ආවරණය කරගැනීමෙන් අනතුරුව මහජන බැංකුවේ සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවල කර ඇති ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් ලැබෙන ස්ථාවර තැන්පතු පොලී ඉපයීම් යොදා ගනී.

ආයෝජන වර්ගය	බැංකුව	2020/12/31 (රු.)	2019/12/31 (රු.)
ස්ථාවර තැන්පතු	මහජන බැංකුව	233,139,593	51,349,255
ස්ථාවර තැන්පතු	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	23,684,759	21,711,444
එකතුව		**256,824,352**	**73,060,699**

2.5.3 මෙහෙයුම් ආදායම

2020 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 112 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 52.7 2019 වසර තුලදී මෙහෙයුම් ආදායම හා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය පිළිවෙලින් රුපියල් මිලියන 108.7 ක් හා රුපියල් මිලියන 42.1 ක් විය . ස්ථාවර තැන්පතු පොළි ආදායම් වර්ධනය වීමත්, අනෙකුත් ආදායම් ඉහල යාමත්, මුදල් අමාත්‍යාංශය වෙතින් 2015 වසරේ ලැබුණු මෝටර් රථ 2ක් සඳහා ගෙවීම් සහ පවරා දීමෙන් අනතුරුව මුදල් අමාත්‍යාංශය - පරිත්‍යාග ලෙස අවසන් ගිණුම් වල පෙන්නුම් කරන ලැබුණු මුදල 2016-2020 වසර දක්වා ලාභයට එකතු කල යුතු බැවින් එම වටිනාකමින් 2020 අයත් කොටස වර්ෂයේ ආදායමට එකතු වීමත්, හේතුවෙන් මෙහෙයුම් ආදායම 2019 සාපේක්ෂව 2020 වසරේ දී 25% කින් වර්ධනය වීමක් අත්පත් කරගෙන ඇත.



03

සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 කාර්ය මණ්ඩල පුහුණුව - 2020

2020 වසරේ මුල් භාගයේදී ශ්‍රී ලංකාව තුල පැතිරී ගිය කොරෝනා වෛරසය නිසා උද්ගත වූ වසංගත තත්වය පාලනය කිරීමටත් ජන ජීවිතය හා රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමටත් සෞඛ්‍ය නීති රීතින්, සංචරණ සීමා, පොලිස් ඇඳිරි නීතිය හා සේවාස්ථානවලට සේවකයන් නොකැඳවා නිවසේ සිට රාජකාරි කිරීමට සැලැස්වීම සිදුවිය. වසංගත තත්වය හමුවේ ගන්නා ලද උක්ත පියවර නිසා සාමාන්‍ය ලෙස පවත්වාගෙන ආ රාජ්‍ය යන්ත්‍රනය බණ්ඩනය වීම සේවකයන්ගේ පැමිණීම අඩුවීම, සෞඛ්‍යාරක්ෂණය සඳහා වැඩි අවධානයක් යොමු වීම, වියදම් සීමා කිරීමට සිදු වීම සහ පුද්ගල සෞඛ්‍යාරක්ෂණය හා ආයතන සෞඛ්‍යාරක්ෂණය වෙනුවෙන් වැඩි වියදමක් දැරීමට සිදුවීම යන කරුණු හේතුවෙන්ද චක්‍රීය ක්‍රමයට සේවකයන් සේවයට වාර්තා කිරීම හෝ සේවාස්ථානයට නොකැඳවා නිවසේ සිට රාජකාරී කිරීමට සැළැස්වීම නිසා කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ඒ වෙනුවෙන් වැය කිරීම අත්හිටුවන ලදී.

3.2 අරමුදලේ බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටින්

උසස්වීම් සහ නව බඳවා ගැනීම්.

3.2.1 2020 වසරේදී අරමුදලේ කාර්ය මණ්ඩලයේ උසස්වීම් දෙකක් ලබා දී ඇත. 2020.05.03 වන දින කළමණාකරණ සහකාර 111 තනතුරු දරණ නිලධාරීන් දෙදෙනෙකු කළමණාකරණ සහකාර 11 ශ්‍රේණියට උසස් කර ඇත. මෙම උසස්වීම 2020.05.03 වන දින සිට සක්‍රිය කර ඇත.

3.2.2 නව බඳවා ගැනීම්

- කොන්දේසි වලට යටත් කර 2018.09.14 වන දින මුල් පත්වීම ලබාදෙන ලද කණිෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්ෂණ නිළධාරි විසින් බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සුදුසුකම් සම්පූර්ණ නොකළ හෙයින් එකී නිළධාරියාගේ පත්වීම 2020.08.31 දින අවලංගු කරන ලදී.
- එම කණිෂ්ඨ නිලධාරියා වෙනුවට එම වසරේදීම 2020. 08.25 දින සේවයට බඳවා ගන්නා ලද නව තොරතුරු තාක්ෂණ නිළධාරිණියද කොරෝනා වසංගත තත්වය හමුවේ 2020 වසරේ අග භාගයේදී එනම් 2020.11.11 දින ඉල්ලා අස්වන ලදි.
- කළමනාකරණ සහකාර 111 ශ්‍රේණියේ නිළධාරීන් තිදෙනෙකු ද (03) විවිධ හේතූන් මත 2020 වසරේදී අරමුදලේ සේවයෙන් ඉල්ලා අස්වන ලදී.
- 2020 වසරේ අග භාගය වන විට සේවක මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා අරමුදලේ නිල වෙබ් අඩවිය මගින් සහ පුවත්පත් දැන්වීම් හරහා ප්‍රචාරණය කිරීමෙන් පසු ආකර්ෂණය කරගත් අයඳුම්පත් අතරින් විනිවිද භාවයකින් යුක්තව සුදුසු අයඳුම්කරුවන් තෝරා විධිමත් සම්මුඛ පරීක්ෂණ මෙහෙයවීම මගින් කළමණාකරන සහකාර 111 තනතුර සඳහා නවක නිලධාරී 06 දෙනකු අරමුදලට බඳවා ගන්නා ලදී.

ඒ අනුව 2020 වසර අවසානයේදී අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයේ කණිෂ්ඨ කළමණාකාර - තොරතුරු තාක්ෂණ තනතුරු 01 , කළමණාකරණ සහකාර (තාක්ෂණික) තනතුරු 01 ක් ද කාර්යාල කාර්ය සහයක තනතුරු 01 ක් ද වශයෙන් පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව 5 ක් විය.

3.3 අරමුදලේ පරිශ්‍රය කොරෝනා වසංගත තත්වයට ඔබිනසේ සැකසීම.

ක්ෂණිකව ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්වය මධ්‍යයේ රාජ්‍ය යාන්ත්‍රනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් අරමුදලේ සේවාදායකයන්ට සෞඛ්‍යාරක්ෂිතව හා කාර්යක්ෂමව ප්‍රශස්ථ මට්ටමේ සේවයක් ලබා දීම සඳහාත් අරමුදලේ ක්‍රියාකාරිත්වය මැනවින් පවත්වාගෙන යාම සඳහාත් අරමුදල් පරිශ්‍රය සහ කාර්යාලය සෞඛ්‍ය නීති රීති වලට අනුකූලව සකස්කර ගැනීම සිදුවිය. ඒ අනුව අරමුදල් පරිශ්‍රයෙහි ප්‍රධාන පිවිසුම අසල අත් සෝදා පිරිසිදු කිරීම සඳහා ජල කරාම සහිත බෙසම් සවි කිරීම, පා පිරිසිදු කිරීම සඳහා විෂබීජ නාශක දියර සහිත පා පිස්නාවන් පිවිසුම් ඉදිරියේ යෙදීම, විෂබීජ නාශක දි යර, අත් ශෝධන දියර හා සබන් ලබා දීම, විටින් විට පරිශ්‍රය විෂබීජානුහරණය කිරීම, කාර්යාලයේ කවුන්ටර, සම්මුඛ පරීක්ෂණ අංශය, ණය අයදුම්පත් භාර ගන්නා කවුළුව හා අයකැමි අසල ඉටි තිර යොදා ආරක්ෂිත ආවරණ සැකසීම වැනි ආරක්ෂිත සැළසුම් හා පියවර ගනු ලැබීය. එමගින් සෞඛ්‍යාරක්ෂිතව සේවාලාභීන්ගේ මෙන්ම සේවාදායකයින්ගේ ද කාර්යක්ෂම අඛණ්ඩ සේවය තහවුරු කරන ලදී.

3.4 කාර්ය මණ්ඩල පරිපාලන හා කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම.

- කාර්ය මණ්ඩල පුහුණුව භාරකාර මණ්ඩල උපදෙස් අනුව අත්හිටුවන ලදී.
- විටින් විට රට තුල පැනවූ සංචරණ සීමා හා ඇඳිරි නීතිය හේතුකොටගෙන 2018 වසරේදී හඳුන්වා දුන් කාර්ය සාධන ඇගයීම් ක්‍රමයට අනුව සේවකයින්ගේ කාර්ය සාධන ඇගයීම හා ලකුණු ලබා දීම සිදු කළ නොහැකි වුයෙන් එම ක්‍රමවේදය 2020 වසරේ දී ක්‍රියාත්මක නොවීය.
- කඩඉම් පරීක්ෂණ හා භාෂා ප්‍රවීණතා විභාගයන්ද නොපැවැත්විය.
- 2020 වසර තුළ පැවතුනු වසංගත තත්වය මත සේවා ස්ථානයට පැමිණ රාජකාරී කිරීම අවම වීම, නිවසේ සිට රාජකාරී කිරීමට සිදුවීම,ඇඟළුම් කර්මාන්ත ශාලා ක්‍රියාකාරිත්වය අඩාළ වීම යන හේතූන්ගේ බලපෑම මත කාර්ය මණ්ඩළය සඳහා වාර්ෂිකව නිකුත් කරන ටී ෂර්ටය 2020 වසරේදී සේවක මණ්ඩළය වෙත නිකුත් නොකරන ලදි.

3.5 කාර්ය මණ්ඩල ණය

ආයතනික කාර්ය මණ්ඩල ණය ක්‍රමවේදය වෙනසකට ලක් නොවුනු අතර පැවති ලෙසම වසර පුරාම ක්‍රියාත්මක කරන ලදී.

3.6 ඉඩම් ඔප්පු සහ බැදුම්කර.

අරමුදල ආරම්භ කළ අවධියේදී, ඉඩම් (ඔප්පු) ඇපයට තබා ණය ලබා ගැනිමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී ඇත. මෙම ක්‍රමය යටතේ ණය ලබා දුන් ඇප බැදුම්කර 267 ක් 1960 වසරේ සිට මෙම ආයතනයට වගකීමක්ව පවතී. මෙම ක්‍රමය යටතේ ණය දීම තවදුරටත් ක්‍රියාත්මක නොවන බැවින් විධිමත් විගණන කමිටු නිර්දේශයකින් අනතුරුව , එම බැදුම්කර අදාළ දේපළ පිහිටා ඇති ප්‍රදේශ අනුව එම දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයවලට බැදුම්කර නිදහස් කර ඒවායේ සඳහන් පාර්ශවයන් නමින් එකී අවලංගු කිරීම් ලියාපදිංචි කර තවදුරටත් මෙම ආයතනය වෙත පැවරී ඇති වගකීම අවසන් කිරීමට 831 භාරකාර මණ්ඩල විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඊට අදාලව බැදුම්කර 191 නිදහස් කර ඇති නමුත් 2020.01.01 සිට 2020.12.31 දින දක්වා කාළය තුළ බැදුම්කර නිදහස් කිරීමක් සිදු වූයේ නැත.

3.7 රැස්වීම්

ගෝලීය වසංගත තත්වය මත 2020 වසර තුළ භාරකාර මණ්ඩල රැස්වීම් 1 ක් ද කාර්ය මණ්ඩළ රැස්වීම් 1 ක් ද පවත්වන ලදි.

කොවිඩ් 19 නව කොරෝනා වෛරසයෙන් ඇති වූ වසංගත තත්වයක් රට තුළ ව්‍යාප්ත වූ අවස්ථාවේදි රාජ්‍ය යාන්ත්‍රනය අකර්මන්‍ය නොවී පවත්වාගෙන යාමට ගත් විධි විධාන යටතේ අරමුදලේ ක්‍රියාකාරිත්වය හා පැවැත්ම තහවුරු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර වියදම් කළමනාකරණය කොට එම සැළසුම් ස්ථාපිත කර මැනවින් පවත්වාගෙන යාම සඳහා සිදු කළ පසු විපරම් ක්‍රියාවලියේ අංගයක් ලෙස විශේෂ රැස්වීම් 8ක් පවත්වන ලදි.

3.8 විගණන හා කළමණාකරණ කමිටුව

2020 ගෝලීය වසංගත තත්වය මත වසර තුල විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් නොපවත්වන ලදී

04

අනාගත සැලසුම්

- වර්තමානයේ රාජ්‍ය සේවකයන්ට පමණක් සපයනු ලබන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය පහසුකම් අනාගතයේ දී පෞද්ගලික අංශයේ සේවකයින්ට ද ලබා දීමට හැකි වන පරිදි මුදල් උත්පාදනය කර ගැනීම සඳහා ලෝහෝර් ආර්යා අරමුදල් පනතේ වගන්ති වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම.

- අරමුදල සේවා සම්පාදන මට්ටමේ ණය දෙන ආයතනයක් බවට පත්කොට එහි වපසරිය සහ ක්‍රියාකාරකම් ණය ලාභීන්ට ප්‍රයෝජනවත් පරිදි වෙනස් කිරීම.

Ranwatta & Co.
CHARTERED ACCOUNTANTS
SUMITH RANWATTA MBA, FCA, FCMA, FMAAT, FCPM

141/3,VAUXHALL STREET,
COLOMBO 02, SRI LANKA.
TEL : +94 11 2543148,
: +94 11 2543149, +94 11 2543011
FAX +94 11 4716922
E-mail : sumith@ranwattaco.lk
ranwatta@sltnet.lk

ස්වාධීන විගණකගේ වාර්තාව

ලෝහෝර් ආර්යා ණය අරමුදල් සාමාජිකයන් වෙත

මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව

මතය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදි.

2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව අප විසින් දරන්නා වූ මතය වේ.

මතය සඳහා පදනම

අප විසින් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලදී. එම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම් පිළිබඳව අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම යන ඡේදය යටතේ වැඩිදුරටත් විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළ වන පරිදි අප අරමුදලෙන් ස්වාධීන විගණකවරු ලෙස කටයුතු කරන අතර, ආචාර ධර්ම සංග්‍රයේ දැක්වෙන අනෙකුත් වෘත්තීය ආචාර ධර්මයන්ට අනුකූලව ද අප විසින් කටයුතු කර ඇත. අප ලබා ගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකාරිත්වයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වන අතර, එකී මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු වීම සඳහා අවශ්‍යයැයි හැඟෙන අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දී භාවිතා කිරීමට ද කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ . ආයතනය ඇවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවැත්වීම තීරණය කර ඇති විටක හෝ ඉහත විකල්පයන් හැර වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක හැර ආයතනය විසින් අඛණ්ඩ පැවැත්ම උපකල්පනයට අනුකූලව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ .සමාගමේ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයේ වගකීම වනුයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වේ .

මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් පිළිබඳ වැඩිදුර විස්තරයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති කමිටු වෙබ් අඩවිය :http://slaasc.com/auditing/auditorsresponsibility.php.හි සඳහන් කර ඇත. මෙම විස්තරය අපගේ විගණක වාර්තාවේ කොටසකි.

වරලත් ගණකාධිකාරීන්
දිනය : 20/01/2022
කොළඹ 02.

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	31/12/2020 රු.	31/12/2019 රු.
පොලී ආදායම	5	112,043,737	108,730,354
අනෙකුත් ආදායම්	6	2,388,896	2,950,113
මෙහෙයුම් වියදම්			
පුද්ගල වැටුප් වියදම්	7	(34,128,246)	(31,550,905)
භූමිය, උපකරණ, ආයතනික වියදම්	8	(13,556,832)	(20,648,233)
ගාස්තු සහ කොමිස්	9	(797,044)	(1,394,005)
		(48,482,122)	(53,593,143)
බදුකරණයට පෙර ලාභය		65,950,511	58,087,324
බදු වියදම්	10	(13,197,841)	(15,940,799)
වර්ෂය සඳහා ලාභය		52,752,670	42,146,525

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන	31/12/2020	31/12/2019
වත්කම්		රු.	රු.
ජංගම වත්කම්			
මූල්‍යමය හා කෙටි කාලීන වත්කම්	11	16,057,239	28,335,925
ණය සහ අත්තිකාරම්	12	342,144,275	454,619,719
භාණ්ඩ ලේඛණ		293,726	252,330
අනෙකුත් වත්කම්	13	2,226,925	1,818,761
		360,722,165	485,026,735
ජංගම නොවන වත්කම්			
ස්ථාවර තැම්පතු මත ආයෝජනය	14	256,824,352	73,060,699
දේපළ පිරියත හා උපකරණ	15	83,146,654	85,183,310
ආයෝජන (දේපල)	16	26,247,617	27,238,094
		366,218,623	185,482,103
මුළු වත්කම්		726,940,788	670,508,838
ජංගම වගකීම්			
අනෙකුත් වගකීම්	17	15,131,193	11,660,192
ආදායම් බදු	18	6,157,888	7,284,797
		21,289,081	18,944,989
ජංගම නොවන වගකීම්			
පරිත්‍යාග - මුදල් අමාත්‍යාංශය	19	-	2,093,230
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	20	20,846,540	17,295,208
		20,846,540	19,388,438
මුළු වගකීම්		42,135,621	38,333,427
ශුද්ධ වත්කම්		684,805,167	632,175,411
ශුද්ධ වත්කම්			
සමුච්චිත අරමුදල		538,155,581	485,525,825
ප්‍රත්‍යා ගණන සංචිත		146,649,586	146,649,586
මුළු ශුද්ධ වත්කම්		684,805,167	632,175,411

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට මින් සහතික වෙමි.

.....
ගණකාධිකාරී

මෙම මූලය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම භාරකාර මණ්ඩලය විසින් දරනු ලැබේ.

භාරකාර මණ්ඩලය වෙනුවෙන් අත්සන්

.....
සභාපති
දිනය : 2022.01.20

.....
පාලන භාරකාර
දිනය : 2022.01.20

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය

	ප්‍රත්‍යා ගණන සංචිතය	සමුච්චිත ලාභය රු.	මුළු ශුද්ධ වත්කම් රු.
2018.01.01 දිනට ශේෂය	146,649,586	443,365,189	**590,014,775**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	14,111	**14,111**
වසරේ ලාභය	-	42,146,525	**42,146,525**
2019.12.31 දිනට ශේෂය	**146,649,586**	**485,525,825**	**632,175,411**
2020/01/01 දිනට ශේෂය	146,649,586	485,525,825	**632,175,411**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	(122,914)	(122,914)
වසරේ ලාභය	-	52,752,670	52,752,670
2020.12.31 දිනට ශේෂය	**146,649,586**	**538,115,581**	**684,805,167**

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2020/12/31 රු.	2019/12/31 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
වසරේ ශුද්ධ ලාභය	65,950,511	58,087,324
ගැලපීම්		
ක්ෂය	4,241,204	8,200,315
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,551,332	2,625,451
පෙර වසර සඳහා වූ ගැලපීම්	(122,914)	14,111
රජයේ දීමනාවන්	(2,093,230)	(2,093,227)
ස්ථාවර තැම්පතු මත පොලී ආදායම	(8,763,653)	(7,721,536)
මෙහෙයුම් වත්කම් වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	**62,763,250**	**59,112,438**
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය		
භාණ්ඩ ලේඛන (වැඩිවීම්/අඩුවීම්)	(41,396)	(15,534)
ණය සහ අත්තිකාරම් (වැඩිවීම්/අඩුවීම්)	112,475,443	(88,753,820)
අනෙකුත් වත්කම් (වැඩිවීම්/අඩුවීම්)	(408,164)	2,021,313
අනෙකුත් වගකීම් (වැඩිවීම්/අඩුවීම්)	3,471,001	(254,392)
	115,496,884	**(87,002,433)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	178,260,134	(27,889,995)
බදු ගෙවීම්	(14,324,749)	(13,868,537)
	(14,324,749)	**(13,868,537)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද/ භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය	**163,935,385**	**(41,758,532)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(1,214,071)	(1,087,663)
ආයෝජන වල (වැඩිවීම්/අඩුවීම්)	(183,763,653)	41,563,206
ලද පොලී	8,763,653	7,721,536
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(176,214,071)**	**48,197,079**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය	-	-
මුදල් හා සමාන දෑ වල ශුද්ධ (වැඩිවීම්/අඩුවීම්)	(12,278,686)	6,438,547
වර්ෂය ආරම්භයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	28,335,925	21,897,378
වර්ෂය අවසානයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	**16,057,239**	**28,335,925**
වර්ෂ අවසානයේ ශේෂ පත්‍රය/ මුදල් සහ ඒ හා සමාන දෑ		
තැම්පතු මුදල්	16,037,239	28,315,925
අතැති මුදල්	20,000	20,000
	16,057,239	**28,335,925**

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. පොදු

1951 අංක 38 දරන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ (භාරකාර මණ්ඩලය) පනත (1956 සංශෝධිත) මඟින් ස්ථාපනය කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදල ශ්‍රී ලංකාවේ නීත්‍යානුසාරී අරමුදලකි. අරමුදලෙහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි අංක 100,3/2 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.1 අනුකූලතා ප්‍රකාශණය

මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවය. (SLPSAS)

1.2 මූල්‍ය ප්‍රකාශණ සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා භාරකාර මණ්ඩලය වගකීම දරයි.

1.3 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශණ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.4 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

සියළුම ද්‍රව්‍ය පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර අවශ්‍යතන්හි මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අදාල සටහන් වල ගැලපුම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

1.5 බදු

වර්තමාන බදු
මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් වන ආදායම් බදු ගණනය ආදායම් බදු විධිවිධාන අනුකූලව ආදායම් හා වියදම් මූලද්‍රව්‍ය මත 2017 අංක 24 දරණ සංශෝධිත ආදායම් බදු පනතට අනුව සිදු කර ඇත.

1.6 ආනුශංගික තොරතුරු

ණය අරමුදලට අදාල වන ප්‍රතිපත්තීන් වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පූර්ව වර්ෂයේ යොදා ගන්නා ලද ප්‍රතිපත්තීන් හා අනුකූල වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී පූර්ව වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර තිබේ.

02. වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම

2.1 බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන

බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන්නේ භාරකරුවන් විසින් සිදුකරනු ලබන සමාලෝචන පදනම් කරගෙන වන අතර පාරිභෝගිකයින් සඳහා වූ ණය වාර්තාකරනු ලබන කාල සීමාව අවසානයේදී ඉදිරියට ගෙන යන ලද හිඟ ශේෂයෙන් සපයනු ලබන ප්‍රතිපාදන අඩු කර තිබේ.

2.2 ස්ථාවර තැන්පතු

නුදුරු අනාගතයේ දී කෙටිකාලීන වෙළඳාමක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහ අනෙකුත් පොලී තැන්පත් සුරැකුම්පත් සඳහා වියදම් වශයෙන් එකතු කරනු ලැබේ.

2.3 දේපල පිරියත සහ උපකරණ

දේපල පිරියත සහ උපකරණ මිලදි ගැනීමේ පිරිවැය සහ ඒ මත යෙදෙන යම් වියදම් ද දක්වා තිබේ.මෙම වත්කම් පහත සඳහන් කර ඇති සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර ලැබෙන පිරිවැයට දක්වා ඇත.

ගොඩනැගිලි	4%
ගෘහ භාණ්ඩ සවි කිරීම්	10%
පරිසණක උපකරණ	25%
කාර්යාල උපකරණ	10%
විදුයුත් අනුසිහුම්	10%
මෝටර් රථ	25%

2008/09 වසරේ සිට ණය අරමුදල එහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ඒවා බැහැර කරන මාසය දක්වා ක්ෂය කිරීම පිණිසය.

2007/08 වසර සඳහා වර්ෂය තුලදි භාවිතා කරන ලද වත්කම් සඳහා ද ක්ෂය කිරීම සිදු නොකරන ලද අතර වත්කම් බැහැර කරන වසර තුළදි ද ක්ෂය කිරීම සිදු නොකරන ලදි.

2.4 අනෙකුත් ලැබිය යුතු දෑ

අනෙකුත් ලැබිය යුතු දෑ සඳහන් කර ඇත්තේ එම නිශ්කාශනය කිරීම සඳහා තක්සේරු කරන ලද ප්‍රමාණයට අනුවය.

2.5 මුදල් හා ඒ සමාන දෑ

මුදල් හා මුදල් සමාන අයිතම ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන මුදල් අගයට සැලකිය යුතු වෙනසක් ඇති නොවන ආකාරයට මුදල් හුවමාරු කර ගත හැකි මූල්‍යමය වත්කම් ලෙස නිර්වචනය කර ඇත.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශණය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කර ඇත.

03. වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දන්නා සියළුම වගකීම් ඉදිරිපත් කර තිබේ.

3.1 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන් වල අරමුදලෙහි ප්‍රාග්ධන බැඳීම් අනාවරණය කර ඇත.

3.2 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සපයා ඇත. භාරකාර මණ්ඩලය විසින් යොදා ගනු ලබන පාරිතෝෂික සමීකරණයට අනුකූලව ප්‍රතිපාදන ගණනය කර තිබේ.

3.3 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාපිත තත්ත්වයන් හා රෙගුලාසි මත ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වී ඇත. අරමුදල විසින් 16% සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයක් ද, 3% සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයක් ද සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම දරනු ලබයි.

04. ආදායම් ප්‍රකාශනය

4.1 ආදායම් හඳුනා ගැනීම

4.1.1 ණය පොලී ආදායම

ණය පොලී ආදායම උපචිත පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබාදුන් ණය වලින් මාස 03 ක් සඳහා ණය ප්‍රතිපාදන නොලැබුණු ක්‍රියාකාරී නොවන ණය පිළිබඳ අරමුදල අවධානය යොමු කරන අතර ඉන් පසුව එම ණය මත ලැබෙන පොළිය මුදල් පදනම මත ගණනය කරනු ලබයි.

4.1.2 බදු කුලී ආදායම

බදු ගිවිසුම මත අරමුදල් පරිශ්‍රයේ පදිංචිව සිටින කුලී නිවැසියන්ගේ ගොඩනැගිලි කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

4.1.3 වියදම් හඳුනාගැනීම

ණය අරමුදල අඛන්ඩව පවත්වාගෙන යාමට සහ ස්ථාවර වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමෙහිලා ජනිත වන සියළුම වියදම් වසරේ ලාභය ගණනයේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

යම් වත්කමක පවත්නා ස්වභාවය වැඩිදියුණු කිරීමට ව්‍යාප්ත කිරීමට වත්කමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරනු ලබන හෝ ණය අරමුදලෙහි ඉපයීම් ධාරිතාව වැඩිදියුණු කිරීමෙහිලා ජනිත වන සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබයි.

		31/12/2020 රු.	31/12/2019 රු.
5	**ආදායම්**		
	රාජ්‍ය සේවකයින් සඳහා වූ ණය	**85,584,502**	**83,768,339**
	කුලී ආදායම	**17,050,859**	**16,518,177**
	ස්ථාවර තැම්පතු සඳහා පොලිය	**8,763,653**	**7,721,536**
	පොලී ආදායම - 11.5% (රු.250,000/- කාර්ය මණ්ඩල ණය)	**355,744**	**393,861**
	නව කාර්ය මණ්ඩල ණය මත පොලී - 4.5%	**235,701**	**245,857**
	පොලී ආදායම් - 11.5% (රු.100,000/- කාර්ය මණ්ඩල ණය)	**49,769**	**77,443**
	විශේෂ අත්තිකාරම් ණය මත පොලී	**3,171**	**4,110**
	පාපැදි ණය මත පොලිය	**338**	**1,031**
		112,043,737	**108,730,354**
6	**අනෙකුත් ආදායම්**		
	මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද දීමනා	**2,093,230**	**2,093,227**
	විශේෂ ආදායම්	**6,750**	**110,320**
	අයැදුම්පත් අලෙවියෙන් ලැබූ ආදායම	**193,350**	**446,700**
	අනෙකුත් ආදායම්	**95,566**	**299,866**
		2,388,896	**2,950,113**
7	**සේවක මණ්ඩල පිරිවැය**		
	වැටුප්	**18,622,368**	**16,816,527**
	දීමනාව (කාර්ය මණ්ඩල දීමනාව)	**4,038,794**	**4,529,180**
	කාර්යාල සේවක අර්ථසාධක අරමුදල	**3,602,716**	**3,338,666**
	විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	**3,551,332**	**2,625,451**
	පාලන භාරකාරතුමාගේ දීමනාව	**1,705,958**	**1,160,221**
	වාර්ෂික ප්‍රසාද දීමනා	**675,625**	**680,625**
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	**675,232**	**625,381**
	සභාපති දීමනාව	**426,220**	**374,356**
	විශේෂ අත්තිකාරම්	**409,453**	**404,129**
	පාලන භාරකාරතුමියගේ ඉන්ධන දීමනාව	**231,353**	**250,580**
	අතිකාල	**140,660**	**220,353**
	භාරකාර මණ්ඩල සාමාජික දීමනා	**33,000**	**385,898**
	හිඟ වැටුප්	**15,535**	**5,618**
	විගණන කමිටුව	**-**	**101,920**
	නිල ඇඳුම්	**-**	**32,000**
		34,128,246	**31,550,905**

		31/12/2020	31/12/2019
		රු.	රු.
8	**පරිශ්‍රය, උපකරණ සහ ස්ථාපිත වියදම්**		
	ක්ෂය වීම	**4,174,351**	**8,200,313**
	වරිපනම් සහ රජයේ ඉඩම් සඳහා බදු	**1,844,600**	**1,897,728**
	ආරක්ෂක ගාස්තු	**1,727,710**	**1,798,841**
	මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය	**1,689,902**	**2,147,338**
	නඩත්තු - විදුලි සෝපාන	**959,882**	**248,639**
	විදුලිය	**845,476**	**1,043,803**
	නඩත්තු - පරිගණක	**653,338**	**538,110**
	ඉන්ධන සහ මෝටර් රථ ගාස්තු	**505,163**	**519,536**
	දුරකථන	**366,259**	**357,409**
	නඩත්තු - කාර්යාල උපකරණ	**232,955**	**338,227**
	තැපැල් හා විදුලි පණිවිඩ	**206,180**	**281,043**
	ජලය	**95,749**	**186,819**
	ගොඩනැගිලි රක්ෂණ	**74,618**	**74,618**
	දැන්වීම්	**69,768**	**60,760**
	මුද්දර ගාස්තු	**65,700**	**74,950**
	පුවත්පත් හා වාරප්‍රකාශන	**21,074**	**21,044**
	නිල බංගලා වියදම්	**7,392**	**-**
	රජයේ ඉඩම් බදු	**5,000**	**5,000**
	ප්‍රවාහන	**2,200**	**2,400**
	නඩත්තු - ගොඩනැගිලි	**9,515**	**2,167,483**
	වාහන සඳහා රක්ෂණ	**-**	**238,708**
	පරිත්‍යාග	**-**	**18,000**
	කාර්ය මණ්ඩල පුහුණු	**-**	**427,464**
		13,556,832	**20,648,233**
9	**ගාස්තු සහ කොමිස් මුදල්**		
	නීති ගාස්තු	**364,800**	**252,768**
	ණය අලාභ සඳහා ප්‍රතිපාදන	**296,794**	**151,794**
	විගණන ගාස්තු	**75,000**	**75,000**
	බැංකු ගාස්තු	**49,510**	**124,626**
	පරීක්ෂාකිරීමේ ගාස්තු	**5,940**	**-**
	වෘත්තීය ගාස්තු	**5,000**	**468,350**
	ජාතිය ගොඩැනැගීමේ බදු	**-**	**301,946**
	මූල්‍ය වියදම්	**-**	**19,521**
		797,044	**1,394,005**

			31/12/2020	31/12/2019
			රු.	රු.
10	**බදු සඳහා වියදම්**			
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය			
	බදු පෙර ලාභය		**65,950,511**	58,087,324
	අනෙකුත් ආදායම්		**-**	(6,158,438)
	බදු වලින් නිලව් කිරීමට එකඟ වී ඇති වියදම්		**8,022,477**	15,161,743
	බදු වලින් අඩු කිරීමට හැකි වියදම්		**(651,652)**	(670,635)
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය		**73,321,336**	66,419,994
	මුළු බදු ආදායම		**73,321,336**	66,419,994
	ආදායම් බදු වියදම් 18%		**13,197,841**	15,940,799
			13,197,841	15,940,799
11	**මුදල් හා කෙටි කාලීන අරමුදල්**			
	මහජන බැංකුව - 204100 1600 85389		**12,942,777**	26,458,932
	මහජන බැංකුව - 204100 1800 85388		**2,072,770**	1,385,767
	මහජන බැංකුව - 204100 2500 85389		**1,021,692**	471,226
	අතැති මුදල්		**20,000**	20,000
			16,057,239	28,335,925
12	**ණය සහ අත්තිකාරම්**			
	රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය	**12.1**	**332,481,497**	445,058,258
	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	**12.2**	**9,662,778**	9,561,461
			342,144,275	454,619,719
12.1	**රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය**			
	රාජ්‍ය සේවකයින්/ රාජ්‍ය සංස්ථා සඳහා ණය		**322,992,299**	437,498,482
	ක්‍රියාකාරී ණය		**11,117,299**	8,077,402
	ක්‍රියාකාරී නොවන ණය		**334,109,59**	445,575,884
	ක්‍රියාකාරී නොවන - ණය සඳහා විලම්බන පොලිය		**(1,208,510)**	(394,829)
	ණය අලාභ ප්‍රතිපාදන		**(419,591)**	(122,797)
			332,481,497	445,058,258
12.2	**කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්**			
	කාර්ය මණ්ඩල ණය - දස මස්		**5,895,608**	5,561,449
	කාර්ය මණ්ඩල ණය - 11.5%		**3,756,109**	3,974,949
	පාපැදි ණය		**3,061**	17,063
	උත්සව අත්තිකාරම්		**8,000**	8,000
			9,662,778	9,561,461
13	**අනෙකුත් වත්කම්**			
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි		**1,836,925**	**1,818,761**
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි තැන්පතු		**390,000**	**-**
			2,226,925	**1,818,761**
14	**ස්ථාවර තැම්පතු මත ආයෝජන**			
	ස්ථාවර තැම්පතු		**253,659,297**	**70,996,597**
	ස්ථාවර තැම්පතු මත පොලිය		**3,165,055**	**2,064,102**
			256,824,352	**73,060,699**

15	දේපළ පිරියත හා උපකරණ පිරිවැය	2020.01.01 දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	2020.12.31 දිනට ශේෂය රු.
	සින්නක්කරය				
	බදු ඉඩම්	98,000,000	-	-	98,000,000
	ගොඩනැගිලි	10,400,000	-	-	10,400,000
	මෝටර් රථ	16,008,750	-	-	16,008,750
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	3,682,639	3,790	-	3,686,429
	පරිගණක උපකරණ	5,208,800	1,103,510	(423,500)	5,888,810
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	1,390,342	46,926	-	1,437,268
	කාර්යාල උපකරණ	1,987,767	59,845	-	2,047,612
		136,678,298	**1,214,071**	(423,500)	**137,468,869**

	සමුච්චිත ක්ෂය	2020.01.01 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	2020.12.31 දිනට ශේෂය රු.
	සින්නක්කර				
	බදු ඉඩම්	18,666,667	2,333,334	-	21,000,000
	ගොඩනැගිලි	7,923,808	247,618	-	8,171,426
	මෝටර් රථ	15,930,969	17,187	-	15,948,156
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	3,371,138	68,933	-	3,440,071
	පරිගණක උපකරණ	3,727,433	290,080	(423,500)	3,594,013
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	773,704	109,322	-	883,026
	කාර්යාල උපකරණ	1,101,269	184,254	-	1,285,523
		51,494,988	**3,250,727**	**(423,500)**	**54,322,215**
	ලියාහල අගය	85,183,310			**83,146,654**

16	ආයෝජන දේපළ පිරිවැය/ තක්සේරුව	2020.01.01 දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	2020.12.31 දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	41,600,000	-	**41,600,000**
		41,600,000	-	**41,600,000**

	සමුච්චිත ක්ෂයවීම	2020.01.01 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	2020.12.31 දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	14,361,906	990,477	**15,352,383**
		14,361,906	990,477	**15,352,383**
	ලියාහල අගය	**27,238,094**		**26,247,617**

		31/12/2020	31/12/2019
17	**අනෙකුත් වගකීම්**	රු.	රු.
	ගොඩනැගිලි කුලි තැම්පතු	**8,573,895**	8,183,895
	රාජ්‍ය සේවකයන් සඳහා ලබාදුන් ණය මුදල් වැඩිපුර අයකර ගැනීම	**4,705,705**	1,707,891
	උපචිත වියදම්	**1,436,265**	1,295,252
	ණය හිමියන්	**315,328**	373,154
	අනෙකුත් තැම්පතු - ආරක්ෂක	**100,000**	100,000
		15,131,193	11,660,192
17.1	**ගොඩනැගිලි කුලි තැම්පත්**		
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	**3,540,000**	3,150,000
	ලංකා විදුලිබල මණ්ඩලය	**2,400,000**	2,400,000
	ලංකා විදුලිබල මණ්ඩලය - (තොරතුරු තාක්ෂණ අංශය)	**1,402,500**	1,402,500
	සමුපකාර සේවක කොමිෂන් සභාව	**1,231,395**	1,231,395
		8,573,895	8,183,895
17.2	**ගෙවිය යුතු වියදම්**		
	නීති ගාස්තු	**354,050**	-
	නඩත්තු - ගොඩනැගිලි	**347,906**	614,341
	ආරක්ෂක ගාස්තු	**152,180**	145,880
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	**125,357**	46,592
	වාර්ෂික ප්‍රසාද දීමනා	**77,188**	37,813
	විගණන ගාස්තු	**75,000**	75,000
	ගොඩැනැගිලි රක්ෂණය	**74,618**	74,618
	විදුලිය	**73,269**	88,624
	පරිගණක නඩත්තු	**62,560**	-
	දුරකථන	**33,835**	26,574
	අතිකාල	**18,501**	-
	මුද්දර ගාස්තු	**17,875**	17,975
	පාලන භාරකාර	**10,054**	-
	ජලය	**7,872**	7,913
	විශේෂ දීමනා	**6,000**	8,297
	වෘත්තීය දීමනා	**-**	99,513
	එකතු කළ අගය මත බදු	**-**	51,405
	වැටුප්	**-**	707
		1,436,265	**1,295,252**
18	**බදුකරණය සඳහා ප්‍රතිපාදන**		
	වසර ආරම්භයේ දී ශේෂය	**7,284,797**	**5,212,534**
	වසර සඳහා වූ ප්‍රතිපාදන	**13,197,841**	**15,940,799**
	බදු ගෙවීම්	**(14,324,749)**	**(11,872,791)**
	රඳවා ගැනීමේ බදු	**-**	**(1,995,746)**
	වසර අවසාන ශේෂය	**6,157,888**	**7,284,797**
19	**මුදල් අමාත්‍යාංශයේ ලැබීම්**		
	වසර ආරම්භයේ ශේෂය	**2,093,230**	**4,186,455**
	වසර තුල පරිවර්තන	**(2,093,229)**	**(2,093,229)**
	වසර අවසාන ශේෂය	**-**	**2,093,230**
20	**විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**		
	වසර ආරම්භයේ ශේෂය	**17,295,208**	**14,669,757**
	වසර සඳහා වූ ප්‍රතිපාදන	**3,551,332**	**2,625,451**
	වසර තුල දී ගෙවීම්	**-**	-
	වසර අවසාන ශේෂය	**20,846,540**	**17,295,208**

Govt. Press, Sri Lanka